idential nature
request.

41

55



## 1981.06.02 වෙනිදින පැවැති කෘෂිකර්ම සංගණන

## <u>සාකච්ඡාවටය</u>

<u>සහභාගිවූ අය :</u>

1. ඒ.ඒ.ඩී.සී.යසසිරි මයා. : සහකාර අධ්‍යක්ෂ
2. විමල් නානායක්කාර මයා. : සහකාර අධ්‍යක්ෂ
3. කේ.ජයසිංහ මයා : සංඛ්‍යාලේඛනඥ
4. එච්.ඇන්.සිරිවර්ධන මයා. : සංඛ්‍යාලේඛනඥ

මෙහිදී පහත සඳහන් තීරණ ගන්නා ලදි.

1. සාමාන්‍ය උපලේඛනයේ 7 කොටස ගොවි උපකරණ කොටස් 2 කට බෙදිය යුතුද ? යන ප්‍රශ්නය පැන නැගුනත් අවසානයේ වෙන් කර ඇති තීරු එලෙසම තැබීමට සාකච්ඡා විය. එසේ වුවත් සෑම උපකරණයක්ම වාගේ අතින් හෝ සතුන් මගින් හා විදුලි බලයෙන් ක්‍රියා කරන ඒවා නිසා එලෙසම බෙදීම සුදුසු බව පිළිගන්නා ලදි.

2. නියදි පෝරමය - සාමාන්‍ය පෝරමයේ මෙහි අදාල කේත නොවූ එක පැත්තකට ගත යුතුද ? යන ප්‍රශ්නය පැන නැගුනත් තීරණයක් නොගන්නා ලදි.

මෙහි පලමු කොටස ගොවි කාංඩයේ ගත කරන කාලය ගැන බැලීමේදී සකස් කර ඇති පෝරමය අනුව කාරකයාගේ තමාගේ ගොවි කාංඩයේ ගත කළ කාලය පමණයි. ඇතුලත් වන්නේ . එහෙත් ගොවින්ගෙන් වැඩිදෙනෙක් වෙනත් ගොවි කාංඩ වලත් වැඩ කරන නිසා ගොවි කාංඩය අමතක කර ගොවි කාරකයා කෘෂිකර්ම වැඩ කටයුතුවල කොතරම් කාලයක් ගත කරනවාද ? යන්නට මුල් තැන දී ප්‍රශ්න මාලාව සකස් කිරීමට තීරනය විය. ඒ අනුව දැනට සකස් කර ඇති වගුවද වෙනස් කිරීමට තීරණය විය. ගොවිකාරකයා ගොවි කටයුතුවල යොදවන කාලය 1973 දී මෙන් සියයට ගණනක් ලෙස ඇසීමටත් වරගන් තුල 'එකතුව සියක් වියයුතුය.' යනුවෙන් සඳහන් කිරීමට තීරණය විය.

මිශ්‍ර සිඹුදු නියදි පෝර්මයේ දෙවෙනි කොටස අලෙවිය ගැන සාකච්ඡා කිරීමේදී ගොවි පලක් ලෙස ගණන් ගැනීමට සිටිය යුතු අවම සතුන් ගණන කී දෙනෙක්ද ? යන ප්‍රශ්නය ඇසුයෙන් ගොවි කාංඩය යනු කුමක්ද යන්න නිර්වචනය කිරීමට තීරණය විය.

මෙම පෝර්මයේ තුන්වෙනි කොටසේදී අසනු ලබන්නේ ගෘහ කාංඩයේ ආදායමයි. එහෙත් අප ගතයුත්තේ ගෘහ කාංඩයේ ආදායමද ? කෘෂි පවුලේ ආදායමද?යන ප්‍රශ්නය ඇතිවිය. පවුලේ රැකියාවන් කරන කීප දෙනෙක් සිටි නම් ගොවිපලෙන් ලැබෙන ආදායමට වඩා වෙනත් ආදායම් වැඩිවිය හැකිය. ඒ නිසා දත්ත පාවිච්චි කරන මහ බැංකුව, කෘෂිකර්ම පර්යේෂණ ආයතනය, මාර්ග ආයතනය වැනි දත්ත පාවිච්චි කරන ආයතන වලින් විමසා බලා මේ කොටස වෙනස් කිරීමට තීරණය විය.

3. <u>අයිතිය හා ඉඩම් භාවිතය</u> : කැබැල්ලේ පිහිටීම යන කොටසේදීත් උප දිසාපති කොට්ඨාශය බොහෝ දෙනෙකු නොදන්නා බැවින් ඒ දිස්ත්‍රික්කයේ නම යෙදීමටත්, ග්‍රාම සේවක කොට්ඨාශය යන තීරුව වෙනුවට දිස්ත්‍රික්කයේ කේත අංකය යෙදීමටත් තීරණය විය.

තවද උපලේඛන හා ප්‍රශ්නාවලිය පිළිබඳව ඒ ඒ අයගේ අදහස් විමසා අදාල ආයතනවලට කලින් දැනුම් දුන්නත් සමහර ආයතන ඒ ගැන එතරම් උනන්දුවක් නොදක්වා තිබීම නිසා දෙවන වතාවටත් අවශ්‍යම ආයතන සේ සැලකෙන තේ මංඩලය, පොල් මංඩලය රබර් පාලක දෙපාර්මේන්තුව, මධ්‍යම බැංකුව යන ආයතන වල අංශ ප්‍රධානීන් හමුවී ඔවුන්ගේ අදහසක් ද ගෙන අලුතෙන් යමක් ඇතුළත් කිරීමට වුවහොත් අප දැනට සකසා ඇති උප ලේඛනය වෙනස් නොකොට එහි හිස්ව තිබෙන අවසන් පිටුවේ අමතර දේ ඇතුළත් කිරීම සුදුසු බව තීරණය විය.

8. <u>අපගත් තීරණයන් ක්‍රියාත්මක වන අයුරු</u> :

එෆ්.1 හි අදාල තීරය කොතෙක් දුරට නිවරදද යනු අප දැන සිටිය යුතුයි. ඒ නිසා එෆ්.1 පෝරම පරීක්ෂා කොට ඒ පිළිබඳව ක්ෂේත්‍රයට ගොස් තවදුරටත් එහි නිවරදතාවය තහවුරු කර ගත යුතුයි. ඒ කොටස කිරීමට සංඛ්‍යාලේඛනඥ එච්.එන්.සිරිවර්ධන මහතාට පැවරිණ.

9. සාමාන්‍ය උපලේඛනයේ දෙවන කොටසේ දෙවන කොටුව ඒ අයුරුම ගැනීමට තීරණය විය.

10. තුන්වන කොටස් දී අනෙකුත් ගොඩ ඉඩම් පිළිබඳව දැක්වීමේදී විස්තරාත්මකව බෙදා දැක්වීම, මෙහිදී අපහසු නිසාත් එවැනි විස්තරාත්මක නියැද්දේදී ලැබෙන නිසාත් එය මේ අයුරුම ගැනීමට තීරණය වූ අතර, කොකෝවා හා කුරුඳු මෙයට ඇතුළත් කිරීමට තීරණය විය. කොකෝවා ගස් යට වගාවක් නිසා එහි බිම් ප්‍රමාණය මුලු බිම් ප්‍රමාණයට එකතු නොවන ලෙස වක්‍රය සෑදීමටද තීරණය විය.

11. පස්වන කොටසේ පොහොර යෙදවීම රාත්තල් ප්‍රමාණයෙන් මෙහි අසා ඇති හෙයින් දැනට භාවිතා වන මෙට්‍රික් ක්‍රමය නිසා ගණන් ගන්නාගේ පහසුව පිණිස කිලෝ හා රාත්තල් ප්‍රමාණය සැසඳීමේදී වක්‍රයක් උපලේඛනයේම අදාල ප්‍රශ්නය කෙලවර කුඩාවට මුද්‍රණය කිරීමට තීරණය විය.

12. හයවන කොටසේදී බිම් ප්‍රමාණය ගොවි කාංඩයේ මුලු බිම් ප්‍රමාණයට සමාන හෝ අඩු විය යුතුයි.

සාමාන්‍ය උපලේඛනයේදී මෙම වාරිමාර්ග ක්‍රම තිබේද නැද්ද යන්න පමණක් සඳහන් කොට එහිදී නල ලිං ආදියේ ගණන් ගැනීමක් ප්‍රමාණවත් වන අතර නියැද්දේ දී යල මහ වශයෙන් වෙන්කොට විස්තර ලබා ගැනීමත් ප්‍රමාණවත් වේ යනු නිගමනය කරන ලදී.

<u>13.7 කොටස</u>

ගොවි උපකරණ ලබා ගන්නට ඇති හැකියාව පිළිබඳව දැන ඒවා ප්‍රයෝජනයට ගත්තාද නැද්ද යනු විමසා එය තමාගේමද, නැතිනම් වෙනත් අයෙකුගෙන් කුලියට ලබා ගත්තක්ද එසේත් නැත්නම් වෙනත් ක්‍රමයකින් ලබා ගත්තක්ද වශයෙන් විස්තර වන පිරිදි තීරස් තීරු වෙනස් කිරීම සුදුසු බව තීරණය විය.